17 හැවිරිදි හෝ ඊට ආසන්න වයසක පසුවන ශිෂ්‍යාවකට ගුරුවරයෙකු විසින් ලිංගික අතවරයක් සිදුකළ බවට කියැවෙන සිදුවීමට ලැබෙනා මාධ්‍ය ආවරණය දිගින් දිගටම දක්නට ලැබිණි. ඒ අතර භාවාතිෂය ලෙසින් සිදුකළ වාර්තාකරණයන්ද දක්නට ලැබිණි.

"සිසුවියට අමුතු පාඩකම් ඉගැන්වූ අයි.ටී ගුරු" යන සිරස්තලයෙන් යුතුව දිවයින ඉරිදා සංග්‍රහයේ (08/01) පළවී තිබූ ලිපිය ඊට උදාහරණයකි.

මෙය සම්පූර්ණයෙන්ම කතාන්තරයක් ලෙසින්, අතිශයින්ම භාවාතිෂය ආකාරයකින් ලියැවී තිබේ. මෙහිදී පාඨකයන් ලෙසට අප විමසිලිමත් විය යුත්තේ, මෙසේ කතාන්තරමය සහ භාවාතිෂය ලෙසකින් මෙවැනි සිදුවීමක් ඉදිරිපත් කිරීම ඔස්සේ, මෙම සිදුවීම තුළින් විග්‍රහ විය යුතු සමාජ ප්‍රශ්නය සහ එහි සියුම් තොරතුරු යටපත්ව යෑම සම්බන්ධයෙනි.

එසේනම්, මෙවැනි භාවාතිෂය පුවත් ඉදිරිපත් කිරීමක් ඔබ පිළිගන්නේද? මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina**